ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී නාට්‍ය හා රංගකලා/ ස්වභාවික විද්‍යා ගෞරව
උපාධි වැඩසටහන - 2023/2024
පස්වන මට්ටම
අවසාන පරීක්ෂණය 2024
**STU5314 - අධ්‍යාපනයේ මාර්ගෝපදේශය හා උපදේශනය**
කාලය -පැය තුනයි. (03)

---

දිනය - 2024.12.17 වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 1 වන කොටස

01. මනෝවිද්‍යාත්මක උපදේශනය යන්න කෙටියෙන් විස්තරකර, එය පාසල් සන්දර්භය තුළ අවශ්‍ය වන අවස්ථාවක් උදාහරණයක් මගින් දක්වන්න.

02. පාසල් යන වයසේ ශිෂ්‍යයෙකු සමායෝජී වීමට අපොහොසත් වීම සමාජමය වශයෙන් ගැටලුවක් වන්නේ කෙසේද යන්න හේතු දෙකක් (02) දක්වමින් පැහැදිලි කරන්න.

03. පාසල් උපදේශකයෙකු විසින් දැනුවත් කළ යුතු දරුවන්ට අදාළ අංශ තුනක් (03) දක්වන්න.

04. ප්‍රාථමික සිසුන්ගේ හැසිරීම් අධ්‍යයනයට වඩාත් සුදුසු පරීක්ෂණ නොවන උපදේශන සේවා ශිල්ප ක්‍රමයක් සාධාරණීකරණයක් දක්වමින් යෝජනා කරන්න.

05. පාසල් පද්ධතියෙන් බැහැරව ලංකාවේ කාන්තාවන් හා ළමයින් වෙනුවෙන් උපදේශන සේවා සපයන ආයතනයක් නම් කර, එම ආයතනය මඟින් සපයන සේවාවන් දෙකක් (02) සඳහන් කරන්න.

06. වෘත්තීය තේරීම් සඳහා සූදානම් කිරීමට ප්‍රාථමික ශ්‍රේණිවල සිට සිසුන් තුළ සංවර්ධනය කළ යුතු හැකියාවන් පහක් (05) සඳහන් කරන්න.

07. දරුවකුගේ සමාජ විරෝධී හැසිරීමට පාසල හා සම්බන්ධ සාධක බලපාන්නේ කෙසේදැයි උදාහරණ දෙකක් (02) දක්වමින් සාකච්ඡා කරන්න.

08. ඉගෙනුම් දුෂ්කරතා සහිත සිසුන්ට සහාය වීමට ගුරුවරයෙකුට අනුගමනය කළහැකි උපායමාර්ග තුනක් (03) පැහැදිලි කරන්න.

(ලකුණු 05X08=40)

## <u>02 වන කොටස</u>

09. (i.) "පාසල යනු සිසුන් තුළ සමායෝගී පෞරුෂයක් ගොඩ නැගීමට සහාය වන ප්‍රධාන කාරකයකි." සිසුන් තුළ සමායෝගී පෞරුෂයක් සංවර්ධනය කිරීමට බාධා කරන පාසල ආශ්‍රිත සාධක දෙකක් (02) උදාහරණ මඟින් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

**සිද්ධිය**

කසුන්, 12 වන ශ්‍රේණියේ ඉගෙනුම ලබන අතර, ඔහුගේ සුහදශීලී බව හා විශ්වාසනීය පෞරුෂය සඳහා සැමවිටම ඔහු ප්‍රසිද්ධය. කෙසේවෙතත්, මෑතකදී ඔහුගේ ගුරුවරුන් සහ මිතුරන් ඔහුගේ හැසිරීමේ වෙනසක් දැක තිබේ. ඔහු අන් අයගෙන් මගහැරී ඇති බවක් හා පාසල් ක්‍රියාකාරකම්වල අඩුවෙන් නියැලී සිටින අතර, ඔහුගේ ශ්‍රේණි පහත වැටෙන්නට පටන් ගෙන ඇත. කසුන්ගේ දෙමාපියන් මෑතක දී වෙන් වූ අතර, ඔහු චිත්තවේගීය වශයෙන් දුරස් වී ඔහුගේම ලෝකයක ජීවත් වූ තම පියා සමඟ ජීවත් වේ. කසුන්ට දැන් නිවස කළමනාකරණය කිරීමට සහ ඔහුගේ බාල සහෝදර සහෝදරියන් රැකබලා ගැනීමට උත්සාහ කිරීමේ බරක් දැනෙන අතර, ඔහුගේම චිත්තවේගීය දුක්ඛිත තත්ත්වයන්ට මුහුණ දෙයි. ඔහු ආදරය කළ දේවල් වලින් ඔහු තවදුරටත් සතුටක් ලබන බවක් නොපෙනෙන අතර, ඔහුගේ ශක්තිමත් සමාජ සම්බන්ධතා දුර්වල වීමට පටන් ගෙන තිබේ.

(ii.) ඉහත සිද්ධියට අනුව කසුන්ගේ චර්යාමය වෙනසට බලපා ඇති සාධක වර්ග දෙකක් **(02)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) කසුන් තුල හොඳින් සමායෝගීවූ පෞරුෂයක් සංවර්ධනය සඳහා ගුරුවරයෙකු ලෙස ඔබට භාවිත කළ හැකි උපාය මාර්ග තුනක් **(03)** සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

10. (i.) බොහෝ රටවල්වල ක්‍රියාත්මක වන පාසල් මාර්ගෝපදේශන සහ උපදේශන සේවා සංවිධාන ආකාර තුන **(03)** සඳහන් කර ඉන් එක් සංවිධානයක ස්වභාවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) මාර්ගෝපදේශ හා උපදේශන සේවා විමධ්‍යගත කිරීම සිසුන්ට ලබා දෙන උපදේශනයේ ගුණාත්මකභාවයට බලපාන බව ඔබ සිතනවාද? ඔබගේ පිළිතුර හේතු තුනක් **(03)** දක්වමින් සාධාරණීකරණය කරන්න. (ලකුණු 06)

(iii.) පාසල් යන සිසුන් සඳහා උපදේශන හා මාර්ගෝපදේශන සේවාවන් අවශ්‍ය වීමට හේතුවන හේතු හතරක් **(04)** සාකච්ඡා කරන්න. (ලකුණු 08)

11. (i.) වෘත්තීය මාර්ගෝපදේශනයේ සහ උපදේශනයේ අරමුණු පහක් (05) සඳහන් කරන්න.

(ලකුණු 05)

(ii.) (අ) එලි ගින්ස්බර්ග්ගේ (Eli Ginzberg) වෘත්තීය තේරීම පිළිබඳ න්‍යායට අනුව පුද්ගලයෙකුගේ වෘත්තීය සංවර්ධනයේ අදියර තුන **(03)** සඳහන් කරන්න. (ලකුණු 03)

(ආ) වෘත්තීය සංවර්ධන ක්‍රියාවලිය සඳහා එම එක් එක් අදියරෙහි ඇති වැදගත්කම විස්තර කරන්න. (ලකුණු 06)

(iii.) එලි ගින්ස්බර්ග්ගේ වෘත්තීය තේරීම පිළිබඳ න්‍යායේ මූලික සංකල්ප හා ඩොනල්ඩ් සුපර්ගේ වෘත්තීය වර්ධනය පිළිබඳ න්‍යායේ මූලික සංකල්ප අතර ඇති වෙනස පරීක්ෂා කරන්න. (ලකුණු 06)

12. (i.) සිග්මන්ඩ් ෆොයිඩ්ගේ මනෝවිශ්ලේෂණ න්‍යාය සහ කාල් රොජර්ස්ගේ පුද්ගල කේන්ද්‍රීය න්‍යාය අතර, වෙනස්කම් තුනක් **(03)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(ii.) කාල් රොජර්ස්ට අනුව ඵලදායි උපදේශන ක්‍රියාවලියක් සඳහා බලපාන ප්‍රධාන සාධක හතරක් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii.) නාට්‍ය හා රංග කලා/ ස්වභාවික විද්‍යා ගුරුවරයෙකු ලෙස සිසුන් තුළ ධනාත්මක ස්ව-සංකල්පයක් සංවර්ධනය කිරීමට ඔබට භාවිතා කළ හැකි ක්‍රියාමාර්ග දෙකක් **(02)** පරීක්ෂා කරන්න. (ලකුණු 06)

13. (i.) කායික නොහැකියා වර්ග හතරක් **(04)** සඳහන් කර ඉන් එක් වර්ගයකට අයත් සිසුන්ගේ ලක්ෂණ පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii.) ඉහත සඳහන් කළ සිසුන්ට ඔබගේ විෂයේ ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේදී සහාය විය හැකි ආකාරය උදාහරණ තුනක් **(03)** මගින් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii.) සුහග සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන කාර්ය සාධනය සාක්ෂාත් කර ගැනීම සඳහා උපකාර කිරීමේ ක්‍රම තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

-හිමිකම් ඇවිරිණි.-